2015

වාර්ෂික වාර්තාව



ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

දැක්ම

රටේ ප්‍රධානතම විදේශ

විනිමය උපයන

ආයතනයක් වීම



මෙහෙවර

සමාගමට ලබා ගත හැකි

සියළු වෙරළාශ්‍රිත බර

ඛණිජ වැලි වර්ග සහ

වෙනත් ස්වාභාවික සම්පත්

වල අගය ප්‍රශස්ථ

මට්ටමින් වැඩි කිරීම

අන්තර්ගතය

ආයතනික තොරතුරු	01 - 02
නිසි බලධාරිගේ පණිවුඩය	03
නිසි බලධාරිගේ වාර්තාව	04 - 08
මූල්‍ය ඉස්මතු කිරීම්	09
විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව	10
ස්වාධීන විගණක වාර්තාව	11 - 12
මූල්‍ය ප්‍රකාශන	13 - 37

ආයතනික තොරතුරු

නම	:	ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්	
නෛතික ස්වභාවය	:	පූර්ණ වශයෙන් ශ්‍රී ලංකා රජයට අයත් සීමාසහිත සමාගමකි.	
සමාගම් ලියාපදිංචි අංකය	:	PB 587	
ලියාපදිංචි කාර්යාලය	:	අංක 341/21, සරණ මාවත, රාජගිරිය	
නිසි බලධාරි	:	ටී. අශෝක පීරිස් මහතා B.A. Hons Economics (පේරාදෙනිය) M.S.S.C (කැලණිය)	
කළමනාකාර කණ්ඩායම	:	එස්. ඥානේස්වරන් මහතා B.Sc.Eng., Associate Member of the Institute of Engineers	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (යන්ත්‍රාගාර/මෙහෙයුම්)
		අයි.පී.එල්. කුමාර මහතා B.Sc.	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වැඩබලන) මානව සම්පත් හා පරිපාලන
		ඩබ්ලිව්.කේ. තමාරා මිය L.I.C.A, APFA	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වැඩබලන) (මූල්‍ය)
		එම්. ඒ.අයි.පී. ජයතිලක මහතා L.I.C.A.	- ප්‍රධාන අභ්‍යන්තර විගණක
		පී. මදුරආරච්චි මහතා B.Sc. (Mgt), DPMM	- සැපයුම් කළමනාකරු
		පී.බී.එම්.විජේබණ්ඩාර මහතා B.Sc.	- අලෙවි කළමනාකරු (වැඩබලන)

විගණකවරු	:	සිසිල් අර්සකුලරත්න සහ සමාගම, වරලත් ගණකාධිකාරීවරු, අංක 8/67, ශ්‍රී සිද්ධාර්ථ පාර, කිරුළපන, කොළඹ - 05.
බැංකුකරුවෝ	:	ලංකා බැංකුව මහජන බැංකුව හැටන් නැෂනල් බැංකුව
ලේකම්වරු	:	සීමාසහිත පී. ඩබ්ලිව්. කෝපරේට් සෙකටේරියල් (පෞද්ගලික) සමාගම, 3/17, කින්සි පාර, කොළඹ 08.

නිසි බලධාරිගේ පණිවුඩය

මම ඉමහත් ප්‍රීතියෙන් යුක්තව 2015 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

ලංකා මිනරල් සෑන්ඩ්ස් සංස්ථාව 1957 වර්ෂයේ දී වෙරළ ආශ්‍රිත බර ඛනිජ වැලි කැනීම හා සැකසීම සඳහා පිහිටුවන ලදී. මෙම සංස්ථාව පූර්ණ රජයට අයත් සීමාසහිත සමාගමක් බවට 1992 පරිවර්තනය කරන ලදී.

ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ නියාමනයන්ට යටත්ව ක්‍රියාත්මක වන වඩාත් සාර්ථක සමාගමකි.

විකුණුම් වටිනාකම රු. මිලියන 1,688 ක් වන අතර,ඒ හේතුවෙන් 2015 හි රු.මිලියන 457 ක බදු පෙර ශුද්ධ ලාභයක් ඉපැයීමට සමත් වී ඇත.

ලාභාංශ සඳහා මහා භාණ්ඩාගාරය වෙත රු.මි. 158.5 ක මුදලක් ලබා දීමට සමාගමට හැකියාව ලැබී ඇත.

වර්ෂය අවසාන සේවක සංඛ්‍යාව 847 කි. සේවක පුහුණුව සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇති අතර, ප්‍රධාන වශයෙන් ඔවන්ගේ ක්ෂේත්‍ර කටයුතු වලට පමණක් නොව ඵලදායිතා වර්ධනය හා ධනාත්මක චින්තනය පිළිබඳව ද පුහුණුව ලබාදී ඇත.

සේවා ස්ථාන 03 හිම සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වැඩමුළු හා පුහුණු පාඨමාලාද ක්‍රියාත්මක කර ඇත.

ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගමෙහි මාසික වියදම රු. මිලියන 100 ක් වන අතර, එය රු. මිලියන 70 ක් දක්වා අඩුකර ගැනීමටත්, මුදල් තැන්පතු 2016 වර්ෂය අවසානයේදී රු. බිලියන 01 ක් දක්වා වර්ධනය කර ගැනීමටත් අපේක්ෂා කර තිබේ.

නව වැඩිදියුණු කරන ලද යන්ත්‍රාගාරය පිහිටුවීම සඳහා කෝකිලායි ප්‍රදේශයේ ඉඩමක් මිළදී ගැනීම ප්‍රධාන පියවරකි.

තවද, නව ප්‍රධාන කාර්යාලය පිහිටුවීම සඳහා අදාල ක්‍රියා මාර්ග ගෙන ඇති අතර, මෙය නාගරික සංවර්ධන අධිකාරිය සමඟ දීර්ඝකාලීන බදු ගිවිසුමක් අත්සන් කර ලබාගනී. රාජගිරිය සරණ මාවතේ පිහිටි ඉඩමේ නුදුරු අනාගතයේදී ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

අපේක්ෂිත අරමුණු ඉටුකිරීමෙහි ලා කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා, ලේකම් සහ කාර්ය මණ්ඩලය හා භාණ්ඩාගාරයේ ජේනරාල් වරයා විසින් ලබා දෙන සහයෝගය සහ අනුබලය ඉතා අගය කොට සලකමි.

අප ළඟා කරගත් ඉලක්ක සඳහා දායකත්වය ලබාදුන් සියළුම මට්ටම්වල සේවකයින්ට මගේ ස්තුතිය හිමිවේ.

ටී. අශෝක පීරිස්,
නිසි බලධාරි.

පුල්මුඩේ ඉදිකිරීමේ වැඩ

(i) වෛද්‍ය මධ්‍යස්ථානය,ශ්‍රවණාගාරය හා ආපන ශාලාව සඳහා

(ii) ගොඩනගන ලද ඒකක 36 කින් යුතු තනිකඩ වාසස්ථානය

(iii) ඒකක 12 කින් යුතු සේවක නිවාස ගොඩනැගීම

(iv) මුහුදු වතුර පොම්පයේ සිට බ්ලොක් ඒ වෙට් ග්‍රැවිටි අප්ග්‍රේඩින් යන්ත්‍රාගාරය දක්වා මුහුදු වතුර සම්ප්‍රේෂණය කිරීමට නළ පද්ධතියක් එලීම

(v) පුල්මුඩේ අයි/ආර්/ඉසඩ් යන්ත්‍රාගාරය දක්වා අමිශ්‍ර ජලය සම්ප්‍රේෂණය කිරීමට යාන්ඔය වතුර ආදනයේ සිට නළ පද්ධතියක් එලීම

(vi) ඉල්මනයිට් තොග කන්ටේනයරයට පැටවීම සඳහා එහා මෙහා කල හැකි කන්ටේනරය සමාගමේ කාර්මික වැඩපල මගින් පිරි සැකසීම

.

නිසි බලධාරීගේ වාර්තාව

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි නිසි බලධාරී විසින් ඔහුගේ වාර්තාව, 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ විගණකගේ වාර්තාව සමග ඉදිරිපත් කර ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම්

ලංකා මිනරල් සෑන්ඩ්ස් හි සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූල වූ අරමුණු :-

- බර ඛණිජ වැලි කැණීම,වෙන් කිරීම, පිරිපහදුව හා සැකසුම් කිරීම.
- බර මුහුදු වැලි සහ එමගින් ලබා ගන්නා වෙළඳ හෝ කාර්මික වටිනා-කමක් ඇති ඕනෑම නිෂ්පාදනයක්, නිෂ්පාදනය හා අලෙවිය.
- බර මුහුදු වැලි පිරිපහදුවේදී හා සැකසුම් ක්‍රියාවලියේදී බිහිවන අතුරු නිෂ්පාදන, නිෂ්පාදනය හා අලෙවිය.

නිෂ්පාදනය

වාර්ෂික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් වලින්,

ඉල්මනයිට්	36,719
රූටයිල්	1,808
සර්කෝන්	615
හයි. ටයි. ඉල්මනයිට්	2,889
නන් මැග්නටික් ටේලින්ස්	54,172
ස්පයිරල් ෆයින් කොන්සන්ට්‍රේට්	1,953
	98,156

විකුණුම්

ඛණිජ වැලි මෙට්‍රික් ටොන් 113,730 ක අලෙවිය තුලින් රු.මි. 1,688 ක අලෙවි ආදායමක් උපයන ලදී.

	මෙට්‍රික් ටොන්	රු. මිලියන
ඉල්මනයිට්	39,447	284
රූටයිල්	945	92
සර්කෝන්	664	78
හයි.ටයි.ඉල්මනයිට්	6,722	54
ස්පයිරල් ෆයින් කොන්සන්ට්‍රේට්	11,780	23
නන් මැග්නටික් ටේලින්ස්	54,172	1,157
	113,730	1,688

ප්‍රතිඵල හා ලාභාංශ

සමාගමේ බදු පසු ලාභය රු.මි.457 කි. නිෂ්පාදන හා මුහුදු යාත්‍රා අංශයෙහි රු.මි. 277 ක් වූ සමුච්චිත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය නොකරන්නට උක්ත ප්‍රකාශිත ලාභය තවදුරටත් ඉහළ යනු ඇත. සීමිත නිෂ්පාදනයෙහි සහ පුල්මුඩේ ප්‍රදේශයෙන් සෘජු නැවිගත කිරීම් නොමැති වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම අන්තර්ග්‍රහණය නොකරන ලද පොදුකාර්ය වියදම් ඇතිවිය.

රුපියල් මිලියන 158.5 ක මුදලක් ලාභාංශ වශයෙන් වෙන්කරන ලදී.

රු.මි.

	2015	2014
දළ ආදායම	1,688	1,220
දළ ලාභය	821	694
ශුද්ධ ලාභය	457	329

දේපළ, පිරියත හා උපකරණ

සටහන් අංක 9 හි විස්තරවලට අනුව 2015 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණවල ලියාහල අගය එහි මූලික පිරිවැය වූ රු. මිලියන 1,073 න් සියයට 44 ක් (44 %) පමණ විය. කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල අගය මිලියන 303 කි.

මෙය යන්ත්‍ර හා යන්ත්‍රාගාර වැඩි දියුණු කිරීම හා නැවත සැකසීම සඳහා වූ පැහැදිලි දර්ශකයක් වේ.

ස්ථාවර වත්කම් වලට වර්ෂය තුළ එකතු කිරීම් රු. මිලියන 148 ක් පමණ විය.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

කොටස් මිලියන 80 කින් සමන්විත රු.මි. 800 ක ප්‍රකාශිත ප්‍රාග්ධනය නොවෙනස්ව පැවතුනු අතර, භාණ්ඩාගාර ලේකම් විසින් සියළුම කොටස් දරයි. විස්තර සටහන් අංක 21 හා සම්බන්ධ වේ.

සංචිත සහ රඳවාගත් ලාභය

සංචිත වල වෙනසක් සිදු නොවුනු අතර 2015 වර්ෂයේ රු.මි. 164 ක ශේෂයක් වූ රඳවාගත් ලාභය 2015 දී රු.මි.458 ක ශේෂයක් දක්වා වර්ධනය විය.

කෙටිකාලීන මූල්‍ය වත්කම්

කෙටි කාලීන මූල්‍ය වත්කම් රු.මි.361 සිට රු.මි. 209 දක්වා අඩු විය.

බදුකරණය

වර්ෂයේ සාමාන්‍ය බදු ප්‍රතිශතය 28% කි. කෙසේ වුවත් අපනයන සඳහා 12% ක සහන බදු ප්‍රතිශතයක් සමාගම භුක්ති විඳී.

කොටස් තොරතුරු

කොටසක මූලික ඉපයීම රු.5.71 කි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශිත දිනට පසුව ඇතිවූ සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනට ගැලපීමක් අවශ්‍ය වන කිසිදු සිදුවීමක් උද්ගත වී නොමැත.

රැකියා ප්‍රතිපත්ති

2015.12.31 වන දිනට සේවකයින් සංඛ්‍යාව 897 ක් විය. සලකා බලන වර්ෂය තුළදී කළමනාකරණය විසින් මානව සම්පත් කළමනාකරණය විශේෂ අවධානයක් යොමු කරන ලදී.

පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ මගින් සේවකයින් පුහුණු කිරීම 2015 වර්ෂය තුළදී ද ඉදිරියට ගෙන එන ලදී.

ව්‍යවස්ථාපිත ගෙවීම්

නිසි බලධාරීගේ දැනුම සහ විශ්වාසයට අනුව සේවකයින්ට සහ රජයට සම්බන්ධ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් අදාල දිනට නිම කර ඇති බවට සෑහීමකට පත් විය හැකිය.

අධ්‍යක්ෂවරුන්ගේ නාමාවලිය

වර්ෂය තුළ වෙනස් වූ (ඉල්ලා අස්වූ) සමාගමේ නාමාවලිය පහත දැක්වේ.

ඩී. ඩබ්ලිව්. ගුණසේකර මහතා - සභාපති/ කළමණාකාර අධ්‍යක්ෂ
(26.01..2015 දින ඉල්ලා අස්විය)
එච්. ජී. සිරිසේන මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
(20.01..2015 දින ඉල්ලා අස්විය)
ආර්. පණ්ඩිතසේකර මහතා - අධ්‍යක්ෂ
(28.01..2015 දින ඉල්ලා අස්විය)
ඩී. බී. ඊ. කුඹද්කඳ මහතා - අධ්‍යක්ෂ
(28.01..2015 දින ඉල්ලා අස්විය)
ආචාර්ය ඩී. එම්. ඕ. ඩී. කේ. දිසානායක මහතා - අධ්‍යක්ෂ
(11.02..2015 දින ඉල්ලා අස්විය)
ජේ.සී. වැලිගමගේ මෙනවිය - අධ්‍යක්ෂ/ මහා භාණ්ඩාගාර නියෝජිත
(30.01..2015 දින ඉල්ලා අස්විය)

රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ සිට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතට අමාත්‍යාංශ වෙනස්වීමේදී 2015 වර්ෂයට අදාලව නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරන ලද අතර එය පහත පරිදි වේ.

ආචාර්ය පී. බී.එම්.එම්. මොරගොල්ල මහතා – සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ
27.01.2015 සිට 28.08.2015

එම්. අයි. බතුර්ඩී මහතා – අධ්‍යක්ෂ
12.02.2015 සිට 28.09.2015
එල්. ඩී. සේනානායක මිය – අධ්‍යක්ෂ
16.03.2015 සිට 29.09.2015
එච්.බී. දයාරත්න මහතා – අධ්‍යක්ෂ
25.03.2015 සිට 28.09.2015

ඩබ්ලිව්.ඒ.උපාලි ගුණවර්ධන මහතා - අධ්‍යක්ෂ
25.03.2015 සිට 26.09.2015
ආචාර්ය එම්.එම්. හිල්මි මහතා – ක්‍රියාකාරී අධ්‍යක්ෂ
21.02.2015(ඉල්ලා අස්වූයේ නැත)

29.09.2015 පටන් අධ්‍යක්ෂ මණ්ඩලය නිසි බලධාරී ලෙස වෙනස් වන ලදී.

අනාගත සැලසුම්

සමාගමේ අනාගත සැලසුම් නම්,

- ❖ අභ්‍යන්තර විදුලි බෙදාහැරීමේ පද්ධතිය නවීකරණය කිරීම හා අළුත්වැඩියා කිරීම.
- ❖ ඉල්මනයිට් නිෂ්පාදනය සහ නන් මැග්නටික් හෙවි මිනරල් කොන්සන්ට්‍රේට් වල ගුණත්වය වැඩි කිරීමට වෙට් හයි ඉන්ටෙන්සිටි මැග්නටික් සෙපරේටර් 03 ක් ප්‍රතිස්ථාපනය කිරීම.
- ❖ පුල්මුඩේ පිහිටි යාන් ඔය සහ අයි.ආර්.ඉසඩ් යන්ත්‍රය දක්වා ජලය හුවමාරු කිරීමේ නල එලීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම.
- ❖ සේවක නේවාසිකාගාර ඒකක 12 ක් සහිත ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීම.
- ❖ "ඒ " කොටසේ පිහිටි වෙට් ග්‍රැවිටි අප්ග්‍රේඩින් ප්ලාන්ට් සඳහා මුහුදු වතුර පොම්ප කිරීමේ පද්ධතියක් ඉදි කිරීම.
- ❖ ඩ්‍රයි මිල්හි පැවති සර්කන් සර්කිට් සඳහා භාවිත කල පරණ යන්ත්‍රය ෆ්ලූයිඩිසඩ් බෙඩ් ඩ්‍රයර් සහ හයි ටෙන්ෂන් රෝලර් සෙපරේටර්ස් 06 ක් සමග ප්‍රතිස්ථාපනය කිරීම.
- ❖ හයි ටෙන්ෂන් රෝලර් සෙපරේටර්ස් සහ හයි ටෙන්ෂන් ප්ලේට් සෙපරේටර්ස් සවිකරමින් රූටයිල් යන්ත්‍රාගාරය වැඩිදියුණු කිරීම.

- වෙට් ග්‍රැවිටි අප්ග්‍රේඩින් ප්ලාන්ට් සඳහා ගොඩනැගිල්ලක් "ඒ" කොටසේ ඉදි කිරීම සහ එම ගොඩනැගිල්ලේ යන්ත්‍ර නව ගොඩනැගිල්ලට මාරු කිරීම.
- මුහුදු වතුර පොම්පයේ සිට "ඒ" කොටසේ වෙට් ග්‍රැවිටි අප්ග්‍රෙඩින් ප්ලාන්ට් එක දක්වා මුහුදු වතුර හුවමාරු කිරීමේ පද්ධතියේ නල එලීමේ කාර්යයන් සම්පූර්ණයෙන් නිම කිරීම.
- ඉල්මනයිට් ගෝ ඩවුන් ඉදි කිරීම
- සර්කොන් නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කල පැරණි ඒවා සඳහා නව වෙට් ටේබල්ස් 07 ක් ප්‍රතිෂ්ඨාපනය කිරීම.
- වෙට් ග්‍රැවිටි අප්ග්‍රෙඩින් එකක් කෝකිලායි ප්‍රදේශයේ ඉදිකිරීම.
- වෙරළ ආශ්‍රිතව පවතින පොල් වගාව සහ දක්ෂිණ නිවාස යෝජනා ක්‍රමය ආරක්ෂා කිරීම සඳහා තාප්පය ඉදි කිරීම.
- සිවිල් යාන්ත්‍රික හා විද්‍යුත් වැඩබිම සහ විද්‍යාගාරය පවතින ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම.
- සින්තටික් රූටයිල්, ටයිටේනියම් ඩයොක්සයිඩ් පිග්මන්ට් සහ ප්‍රිමියම් ග්‍රේඩ් සර්කොන් ෆ්ලාර් වැනි වටිනාකම් එකතු කිරීමේ නිෂ්පාදන ව්‍යාප්ති කිරීම.
- සේවකයින්ගේ සුභ සාධනය වැඩිදියුණු කිරීම සඳහා පුහුණු කිරීම සහ වැඩ කිරීම.
- වඩාත් සුදුසු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පහසුකම් ඇති කිරීම.
- නිසි තොරතුරු සන්නිවේදන තාක්ෂණ කළමනාකරණයක් සඳහා ක්‍රමානුකූල ක්‍රමවේදයක් හඳුන්වාදීම.

නිසි බලධාරීගේ කොටස් හිමිකම

නිසි බලධාරී විසින් සමාගමේ කිසිදු කොටසක් සඳහා හිමිකමක් නොදරන අතර මුළු කොටස් හිමිකම (100 %) මහා භාණ්ඩාගාරය සතුවේ.

සංස්ථාපිත සමාජ වගකීම

සංස්ථාපිත සමාජ වගකීම් ඉටුකිරීම සඳහා සමාගම විසින් රු.මි.0.3ක් වැය කර ඇත. සමාජ සුභසාධන කටයුතු සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම, ආගමික කටයුතු, අධ්‍යාපනික කටයුතු ආදිය මේ යටතේ සිදුකර ඇත.

ගිවිසුම් සඳහා නිසි බලධාරීගේ ඇල්ම

සමාගම සමඟ කිසිදු ඇතිකරගත් ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුම් සම්බන්ධයෙන් නිසි බලධාරීගේ ඍජු හෝ වක්‍ර ඇල්මක් නොමැත.

සාංගමික යහපාලනය/අභ්‍යන්තර පාලනය

සමාගමෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ වගකීම නිසි බලධාරියා විසින් දරනු ලබයි. වත්කම් ආරක්ෂා කිරීම, උචිත ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සහ විශ්වාසනීය මූල්‍ය තොරතුරු උත්පාදනය සහතික කිරීම සඳහා සමාගමේ පාලන පද්ධතිය නිර්මාණය කර ඇත. කෙසේ වුවත්, කිසිදු පාලන පද්ධතියකට 100% ක නිරවද්‍යතාවයක් සහතික කළ නොහැකි අතර ලබාදිය

හැක්කේ ඉහළ මට්ටමේ විශ්වාසනීයත්වයක් පමණි. යම් ආකාරයක වරදක්, නීති රීති උල්ලංඝනය කිරීමක් වාර්තා ගතවූ සැනින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට බැඳී ඇත.

මූල්‍ය ප්‍රකාශ කට්ටලය අත්සන් තබන දින දක්වා අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව පිළිබඳ නිසි බලධාරියා සෑහීමකට පත්වේ.

අඛණ්ඩ පැවැත්ම

නිසි බලධාරි විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය උපයෝගී කරගෙන ඇත.

විගණකවරුන්

සිසිල් අර්සකුලරත්න සහ සමාගම 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා බාහිර විගණකවරුන් ලෙස කටයුතු කරයි.

ලේකම්වරුන්

සීමාසහිත පී. ඩබ්ලිව් කෝපරේට් සෙකටේරියල් (පෞද්ගලික) සමාගම ලේකම්වරුන් ලෙස තව දුරටත් කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
පී. ඩබ්ලිව් කෝපරේට් සෙකටේරියල්
(පෞද්ගලික) සමාගම,
ලේකම්වරු.

පසුගිය වර්ෂ පහ සඳහා වැදගත් මූල්‍ය තොරතුරු

		2011	2012	2013	2014	2015
දළ විකුණුම් ආදායම	- රු.මි.	1,567	1,985	679	1,220	1,688
දළ ලාභය	- රු.මි.	1,304	1,628	500	694	821
වෙනත් ආදායම්	- රු.මි.	200	224	56	56	136
බදු පෙර ලාභය	- රු.මි.	1,107	1,373	30	328	503
බදු පසු ලාභය	- රු.මි.	950	1,190	20	329	457
අන්තර්ග්‍රහනය නොකල පොදුකාර්ය වියදම්	- රු.මි.	248	292	358	259	277
මුළු වත්කම්	- රු.මි.	2,611	2,029	2,400	2,829	2,764
මුළු වගකීම්	- රු.මි.	319	249	715	847	489
කොටස් හිමියන්ගේ හිමිකම	- රු.මි.	2,292	1,780	1,684	1,981	2,276
ආදායම් බදු	- රු.මි.	155	182	10	(2)	46
මහා භාණ්ඩාගාරයට ලාභාංශ සහ ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්	- රු.මි.	500	1,700	43	14	158.5
සේවක සංඛ්‍යාව		611	595	629	636	847
බදු පෙර ශුද්ධ ලාභය හිමිකමේ ප්‍රතිශතයක් ලෙස		48%	77%	2%	17%	22%
බදු පෙර ශුද්ධ ලාභය මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස		42%	68%	1%	12%	18%
ජංගම අනුපාතය		10:1	5:1	2:1	2:1	4:1

විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාවසාය නියමයන්ට අනුකූලව, 2015 ජූනි මස විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී. කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

එල්.ඩී.සේනානායක මිය - සභාපති

එම්.අයි.බතුර්දීන් මහතා - සාමාජික

ඩබ්.ඒ. උපාලි ගුණවර්ධන මහතා - සාමාජික

එච්.බී.දයාරත්න මහතා - සාමාජික

සලකා බලන කාලය තුළදී කමිටුව වරක් රැස්වී අතුරු අභ්‍යන්තර විගණන වාර්තා අංක 2015-01 ගැඹුරින් සාකච්ඡා කරන ලදී. සාමාජිකයන්ගේ යෝජනා අනුව, අදාළ ගැටළු නිරාකරණය කිරීම සඳහා කළමනාකරණය පහත උපදෙස් ලබා දෙන ලදී.

රාජ්‍ය විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් විගණන හා කළමනාකරණ රැස්වීමට නිරීක්ෂකයන් ලෙස සහභාගි විය.

අධ්‍යක්ෂක මණ්ඩලය පත් කිරීමේ ප්‍රමාදය මත සලකා බලන කාලය තුළදී විගණන හා කළමනාකරණ රැස්වීම් වාර 04 ක් පැවැත්වීම නොහැකි විය.

එල්.ඩී.සේනානායක මිය
සභාපති,
විගණන හා කළමනාකරණ කමිටුව.

ස්වාධීන විගණක වාර්තාව

සීමාසහිත ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගමේ සාමාජිකයන් වෙත ඉදිරිපත් කෙරෙන විගණක වාර්තාව

අප විසින් විගණනය කරන ලද, සීමාසහිත ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, කොටස් හිමියන්ගේ ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, ගිණුම් ප්‍රතිපත්ති සහ අදාළ ගිණුම් සටහන්ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන කට්ටලය පිටු අංක 13 සිට 37 දක්වා ඇතුළත්ව ඇත.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ කළමනාකරණ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය වන පරිදි ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. මෙම වගකීම්වලට වංචා හෝ දෝෂ මත ඇතිවිය හැකි ප්‍රමාණාත්මක අවනිදේශන-යන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධවන අභ්‍යන්තර පාලන ක්‍රම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමද, වඩාත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා භාවිතය සහ අවස්ථානුකූලව වඩා සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තුකරණය යනාදිය අයත් වේ.

විගණක විෂය පථය හා විගණන මතය ප්‍රකාශ කිරීමේ පදනම

විගණකයින් වශයෙන් අපගේ වගකීම වන්නේ අපගේ විගණනයෙන් හෙළිවන පරිදි මෙම මූල්‍ය වාර්තාවන් මත අපගේ මතය ප්‍රකාශ කිරීමයි. අපගේ විගණනය පවත්වාගෙන යන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලවය. ඒ අනුව ප්‍රමාණාත්මක වූ වැරදි සහගත ප්‍රකාශවලින්, අදාල මූල්‍ය වාර්තා තොර බව සාධාරණ ලෙස සහතික කළ හැකි වන පරිදි, අපගේ විගණනය සැළසුම් කර පවත්වාගෙන යන ලදී.

ඉහත සඳහන් මූල්‍ය වාර්තාවල ඇතුළත් සංඛ්‍යා පැහැදිලි කිරීම් සහ අදාල කරගත් ගිණුම් ප්‍රතිපත්ති හා කළමනාකරුවන් කර ඇති ඇස්තමේන්තු යනාදිය තහවුරු කරගැනීමට අදාල සාක්ෂි නියැදි පදනමක් යටතේ භාවිතා කළ අතර, මූල්‍ය ප්‍රකාශන ගිණුම් ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර ඇත්දැයි යන්නද පරීක්ෂා කරන ලදී.

විගණනය සඳහා අදාල වේ යැයි විශ්වාස කළ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් අප විසින් ලබාගන්නා ලදී. එම නිසා අප විසින් කරන ලද විගණනයෙන් ප්‍රකාශිත මතය සඳහා ප්‍රමාණවත් පදනමක් ලබාදෙන බව අපගේ විශ්වාසයයි.

තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

01. දේපළ, පිරියත හා උපකරණ

කර්මාන්ත ශාලාව පරීක්ෂා කිරීම සඳහා කළමනාකරණයෙන් අනුමැතියක් ලබා නොදීම හේතුවෙන් සමාගමේ දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධව සත්‍යාපනයක් සිදු කිරීමට අප හට නොහැකිවිය. එමනිසා, දැනට පවතින දේපළ, පිරියත හා උපකරණවල පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය.

තත්ත්වාගණනය කල මතය

තත්ත්වාගණනය කල මතය සඳහා පදනම්වූ ඡේදයේ කරුණු හැරෙන්නට, අපගේ නිරීක්ෂණයන්ගෙන් නිරූපණය වන අපගේ මතය වන්නේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන ගොස් ඇති බවත් 2015 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ ඒ දිනෙන් අවසන් වූ වර්ෂය තුළ ලබාගත් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහයන් සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය වන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බවත්ය.

අනෙකුත් නීති රීති රෙගුලාසි අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (02) වගන්තියේ අවශ්‍යතාවය මත අප පහත සඳහන් දෑ ඉදිරිපත් කරමු.

අ) විගණකගේ විගණන මතය, විෂය පථය හා සීමාකිරීම් ඉහත සඳහන් පරිදිවේ

ආ) අපගේ මතය වන්නේ,

- විගණනය සඳහා අවශ්‍ය සහ අදාළ වේයැයි විශ්වාස කල සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් අප විසින් ලබාගත් අතර, ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන ගොස් ඇති බවත්,
- මෙම මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත්ය.

සිසිල් අර්සකුලරත්න සහ සමාගම,
වරලත් ගණකාධිකාරීන්,
කොළඹ.
2016 මැයි 18 වන දින.

විස්තීර්ණ ආදායම්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2015 රු.	2014 රු.
දළ පිරිවැටුම	3	1,688,079,113	1,219,804,738
එකතු කල අගය මත බද්ද		(184,815)	(23,861)
ශුද්ධ පිරිවැටුම		1,687,894,298	1,219,780,877
විකුණුම් පිරිවැය	4	(866,415,748)	(525,602,242)
දළ ලාභය		821,478,550	694,178,635
වෙනත් මෙහෙයුම් ආදායම්	5	65,927,211	20,576,111
		887,405,761	714,754,746
බෙදාහැරීමේ වියදම්		(14,163,023)	(7,105,969)
පරිපාලන වියදම්		(163,079,380)	(156,780,929)
වෙනත් මෙහෙයුම් වියදම්		(277,045,734)	(258,805,844)
		(454,288,137)	(422,692,742)
මෙහෙයුම් ලාභය		433,117,624	292,062,004
මූල්‍ය ආදායම්	6	69,636,884	35,547,169
වර්ෂයේ බදු වලට පෙර ලාභය		502,754,508	327,609,174
ආදායම් බදු වියදම	7	(45,984,819)	1,882,404
වර්ෂයේ බදු පසු ලාභය		456,769,689	329,491,578
වර්ෂයේ ශුද්ධ ලාභය		456,769,689	329,491,578
කොටසක සාමාන්‍ය ඉපයීම	8	5.71	4
වර්ෂයේ ශුද්ධ ලාභය		456,769,689	329,491,578
විශ්‍රාම පාරිතෝෂිත බැඳියාව සඳහාවූ ශුද්ධ ආයුගණන අලාභය		(3,873,677)	(18,668,816)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		452,896,012	310,822,762

මූල්‍ය තත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට	සටහන	2015 රු.	2014 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	9	779,562,362	514,148,994
කල්බදු ඉඩම්	10	22,476,452	22,779,862
අස්පෘශ්‍ය වත්කම්	11	258,250	578,613
අත්තිකාරම්	13	554,921,448	552,421,448
මුළු ජංගම නොවන වත්කම්		1,357,218,512	1,089,928,917
ජංගම වත්කම්			
තොග	15	800,158,127	960,758,388
කෙටිකාලීන මූල්‍ය වත්කම්	16	208,640,110	360,569,133
අත්තිකාරම් සහ තැන්පතු	17	14,414,611	95,354,664
ඉදිරියට කළ ගෙවීම්	18	35,444,787	33,621,382
ආදායම් බදු	24	---------	16,655,430
අනෙකුත් ජංගම වත්කම්	19	330,084,215	239,933,767
මුදල් හා මුදල් වලට සමාන දෑ	20	18,457,054	31,769,189
මුළු ජංගම වත්කම්		1,407,198,904	1,738,661,953
මුළු වත්කම්		2,764,417,416	2,828,590,870
ස්කන්ධය හා වගකීම්			
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	21	800,000,000	800,000,000
වෙනත් සංචිත	22	1,017,544,343	1,017,544,343
රඳවාගත් ඉපයීම් / (අලාභ)	23	458,024,737	163,628,724
මුළු ස්කන්ධය		2,275,569,080	1,981,173,067
වගකීම්			
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම පාරිතෝෂිත බැදීම	14	63,551,328	62,582,374
විලම්භිත බදු	12	32,100,956	14,616,137
ගෙවිය යුතු ආදායම් බදු		6,096,184	---------
		101,748,468	77,198,511
ජංගම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	25	306,930,104	662,307,372
වෙන්කිරීම් හා උපචිත වියදම්	26	80,169,764	35,114,109
කෙටිකාලීන ණය	27	----------	72,797,811
		387,099,868	770,219,292
මුළු වගකීම්		488,848,336	847,417,803
මුළු ස්කන්ධය හා වගකීම්		2,764,417,416	2,828,590,870

සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූල බව මම සහතික කරමි.

අත්සන් කලේ – ඩබ්ලිව්.කේ.තමාරා - ප්‍රධාන මූල්‍ය නිළධාරි

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම නිසි බලධාරීගේ වගකීමයි. නිසි බලධාරි විසින් අනුමත කර අත්සන් කරන ලදී.

අත්සන් කලේ - ටී. අශෝක පීරිස් - නිසි බලධාරි

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රඳවාගත් ඉපයීම් / (අලාභ)	මුහුදු යාත්‍රා රක්ෂණ නිදන් අරමුදල් සංචිතය	යන්ත්‍ර හා පිරියත ප්‍රතිස්ථාපනය හා වැඩි දියුණු කිරීමේ නිදන් අරමුදල් සංචිතය	ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි නිදන් අරමුදල් සංචිතය	සුනාමි අළුත්වැඩියා නිදන් අරමුදල් සංචිතය	සේවක වන්දි නිදන් අරමුදල් සංචිතය	**එකතුව**
2014 ජනවාරි 01 දිනට ශේෂය	800,000,000	(133,194,037)	111,000,000	706,346,960	171,149,672	18,801,474	10,246,237	1,780,721,002
වර්ෂයේ ලාභය	---------	329,491,578	---------	---------	---------	---------	---------	19,904,713
වෙනත් විස්තීරණ ආදායම	---------	(18,668,816)	---------	---------	171,149,672	18,801,474	10,246,237	1,727,350,306
මුල් විස්තීරණ ආදායම	---------	310,822,762	---------	---------				
භාණ්ඩාගාරයට ලාභාංශ	---------	(14,000,000)	---------	---------	---------	---------	---------	(43,000,000)
2014.12.31 දිනට ශේෂය	800,000,000	163,628,725	111,000,000	706,346,960	171,149,672	18,801,474	10,246,237	1,684,350,306
පෙර වර්ෂයට ගැලපීම වර්ෂයේ ලාභය	800,000,000	163,628,725 456,769,689	111,000,000	706,346,960	171,149,672	18,801,474	10,246,237	1,981,173,068 456,769,689
වෙනත් විස්තීරන ආදායම	---------	(3,873,677)	---------	---------	---------	---------	---------	(3,873,677)
මුළු විස්තීරණ ආදායම	---------	452,896,012	---------	---------	---------	---------	---------	452,896,012
භාණ්ඩාගාරයට ලාභාංශ	---------	(158,500,000)	---------	---------	---------	---------	---------	(158,500,000)
2015.12.31 දිනට ශේෂය	800,000,000	458,024,737	111,000,000	706,346,960	171,149,672	18,801,474	10,246,237	2,275,569,080

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2015 රු.	2014 රු.
බදු වලට පෙර ලාභය/(අලාභය)	502,754,508	327,609,174
ගැලපීම්;		
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය	76,021,455	62,209,097
පොළී ආදායම්	(69,636,884)	35,547,169
පාරිතෝෂිත	10,517,230	8,985,947
සැලසුම් වත්කම්වල සාධාරණ අගය	(234,357)	(231,144)
විශ්‍රාම පාරිතෝෂිත ආයුගණක අලාභය	---------	-----------
දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභ	(1,977,103)	-----------
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	517,444,849	434,120,243
තොගවල වැඩිවීම්/අඩුවීම්	160,600,261	(28,584,079)
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම්/(අඩුවීම්)	(13,533,799)	(138,519,368)
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම්/(අඩුවීම්)	(454,821,612)	69,650,053
ණය පහසුකම්වල වැඩිවීම්/(අඩුවීම්)	(72,797,811)	72,797,810
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල්	136,891,888	409,464,659
ගෙවූ පාරිතෝෂිත	(13,187,595)	(6,798,875)
ගෙවූ ආදායම් බදු	(5,748,387)	(3,626,841)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	117,955,906	399,038,943
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
ආයෝජන සඳහා කළ තැන්පත් කිරීම්	151,929,023	(199,399,257)
පොළී ආදායම	69,636,884	(35,547,169)
නොනිම් ප්‍රාග්ධන වැඩ	(192,226,654)	(80,545,398)
ඉඩම්, දේපළ,පිරියත, උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	(148,648,727)	(9,719,440)
දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීම් වලින් ලද මුදල්	2,041,434	10,338
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(117,268,040)	(325,200,926)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
ගෙවූ ලාභාංශ	(14,000,000)	(43,000,000)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(14,000,000)	(43,000,000)
මුදල් හා මුදල් වලට සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	(13,312,134)	30,838,017
වර්ෂය ආරම්භයේදී තිබූ මුදල් හා මුදල් වලට සමාන දෑ	31,769,188	931,171
වර්ෂය අවසානයේ තිබූ මුදල් හා මුදල් වලට සමාන දෑ	18,457,054	31,769,188
මුදල් හා මුදල් වලට සමාන දෑ විශ්ලේෂණය		
බැංකුවේ ඇති මුදල්	18,275,903	31,581,308
අතැති මුදල්	161,151	167,880
සුළු මුදල්	20,000	20,000
	18,457,054	31,769,188

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. ආයතනික තොරතුරු

1.1 පොදු

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජයට අයත් ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සමාගමකි. එහි ලියාපදිංචි කාර්යාලය රාජගිරිය, සරණ මාවත, අංක 341/21 හි පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

සමාගමේ ප්‍රධානතම කාර්යය වනුයේ බර ඛණිජ වැලි කැණීම, සැකසීම සහ අලෙවිකරණයයි.

කොඩ්බේ ත්‍රිකුණාමලයෙහි ඇති මුහුදු යාත්‍රා අංගනය වසා දැමීමට කටයුතු කර ඇත.

1.3 සමාගමේ සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානයේ දී සමාගමේ සේවක සංඛ්‍යාව 847 ක් විය. (2014 වර්ෂයේ සේවක සංඛ්‍යාව 632 කි.)

2. ප්‍රමාණාත්මක ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය

2.1 සැකසීමේ පදනම

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති - SLFRSs) වලට අනුකූල වන ලෙස පිළියෙල කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRSs) වලට අනුකූලව පිළියෙල කිරීමේ දී නිශ්චිත ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. ඒ සමඟ ම කළමනාකරණයට ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදාගැනීමේ දී ඔවුන්ගේ විනිශ්චයන්ද මේ සඳහා පාදක කරගනී. මෙසේ යොදා ගන්නා ලද ඉහත ඉහළ කළමනාකරණ විනිශ්චයන් සම්බන්ධ පරාසයන්, මෙම මූල්‍ය වාර්තාවලට අදාළ වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු හා කල්පිතයන් සටහන් අංක 2A හි දක්වා ඇත.

2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්කම්

අවස්ථානුරූපී ලෙස පෙර වර්ෂ මූල්‍ය වාර්තා ප්‍රවර්ථන වර්ෂයේ අවශ්‍යතාවයන්ට හා ඉදිරිපත් කිරීම් වලට ගැළපෙන ආකාරයට, ඉදිරිපත් කිරීම් හා නැවත සකස් කිරීම් සිදුකර ඇත.

2.3 විදේශ මුදල් පරිවර්තනය

2.3.1 ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී ව්‍යවහාර මුදල්

ආයතනය ක්‍රියාත්මක වන්නා වු මූලික ආර්ථික පරිසරයට අදාළ වලංගු මුදල් භාවිතා කර මෙම මූල්‍ය වාර්තා වල අඩංගු ගණුදෙනු හා ශේෂයන් වාර්තාකරණය කර ඇත. සමාගමේ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය ලෙස ශ්‍රී ලංකා රුපියල් (LKR) භාවිතා කර මෙම මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

2.3.2 ගනුදෙනු හා ශේෂයන්

ගනුදෙනුව සිදුවන දිනයේ පැවති විනිමය අනුපාතිකය පදනම් කරගෙන විදේශීය මුදලින් සිදුවූ ගනුදෙනු වාර්තාගත මුදල් ඒකකයට පරිවර්තනය කරන ලදී. අදාල ගනුදෙණුව පියවූ දිනයට හා අදාලව මූල්‍ය වත්කම්, ශේෂ පත්‍ර දිනට පරිවර්තනය කිරීමේ දී ඇති වූ විදේශ විනිමය ලාභ හා අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ දක්වා ඇත.

2.4 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ ආරම්භයේ දී එම වත්කම් සමාගමේ කළමනාකරණය බලාපොරොත්තු වන පරිදි භාවිතා කල හැකි තත්වය දක්වා ගෙන ඒමට කරන ලද වියදම් ද සහිතව පිරිවැයට සටහන් කරනු ලබයි.

පසුව දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් එහි සමුච්චිත ක්ෂය හා හානිකරන අලාභ අඩුකල පසු අගයට ගණනය කරනු ලබයි.

පසුකාලීන පිරිවැය වත්කමේ ධාරණ අගයට එකතු කිරීම හෝ වත්කමක් ලෙස සැලකීමට නම් එම පිරිවැය නිසා වත්කමේ අපේක්ෂිත ජිවිත කාලය වැඩිකිරීමට සමත් නම් එයින් ජනනය වන ප්‍රතිලාභ සමාගම තුලට ගලා එන්නේ නම් පමණි. සමාගමට එම පිරිවැය ගණනය කල හැකි විය යුතුයි.

සමාගම අනෙකුත් වත්කමක් එදිනෙදා නඩත්තු කිරීමට හා පවත්වාගෙන යාමට දරන වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි අදාල කාල පරිච්ඡේදයට අයත් වියදමක් ලෙස සලකනු ලබයි.

ඉඩම් ක්ෂය නොකරන අතර අනෙකුත් වත්කම් සරළ මාර්ග ක්ෂය ක්‍රමයට පහත දැක්වෙන පරිදි එහි තක්සේරු කරන ලද ජීවිත කාලය පුරා ක්ෂය කරනු ලබයි.

වැඩබිම් සංවර්ධනය	අවුරුදු 20	5%
ගොඩනැගිලි	අවුරුදු 20	5%
යන්ත්‍රෝපකරණ	අවුරුදු 10	10%
මෙවලම් හා උපකරණ	අවුරුදු 10	10%
ලී බඩු සවිකිරීම් හා උපකරණ	අවුරුදු 10	10%
මෝටර් රථ	අවුරුදු 5 සිට 6.5 දක්වා	15% - 20%

ජල සැපයුම්	අවුරුදු 10	10%
මුහුදු යාත්‍රා	අවුරුදු 10	10%
ගොහොරු පතල්	අවුරුදු 4	25%
පරිගණක දෘඩාංග	අවුරුදු 4	25%

වත්කමක නැවත අයකරගත හැකි වටිනාකම එහි ධාරණ අගයට වඩා වැඩි වන අවස්ථාවක අදාළ වත්කමේ ධාරණ අගය වහාම කපාහරිනු ලැබේ.

වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම දැනට සිදුකර නොමැති අතර, කළමනාකරණය රජයේ තක්සේරුකරුවකු මගින් වත්කම් තක්සේරු කර ගැනීමට උත්සහ දරමින් සිටී.

2.5 අස්පෘශ්‍ය වත්කම්

විශේෂිත පරිගණක මෘදුකාංග හා පද්ධති අත්පත් කරගැනීමට දරන පිරිවැය අත්පත් කරගත් පරිගණක මෘදුකාංග පරිගණක මෙහෙයුම් පද්ධති ලෙස ප්‍රාග්ධනිත කර ඇත. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා හානිකරණ අලාභ අඩුකල අගයට දක්වා තිබේ. පිරිවැය පහත දැක්වෙන තක්සේරු කරන ලද ජීවිත කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

පරිගණක මෘදුකාංග	අවුරුදු 4	25%

පරිගණක මෘදුකාංග පවත්වාගෙන යාමට දරණ ලද වියදම් අදාළ වියදම දැරූ කාල සීමාවේ වියදමක් ලෙස සලකනු ලබයි.

2.6 මූල්‍ය නොවන වත්කම් අපහායනය

සමාගම විසින් සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේ දී එහි දේපළ, පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් හි ධාරණ අගයන් පිළිබඳව විවරණයක් සිදුකල යුතු අතර අපහායනය සිදුකිරීම සඳහා ඇඟවීමක් ඇත්ද යන්න පිළිබඳව සලකා බැලිය යුතුවේ. එම ඇඟවීම් පවතින්නේ නම්, අදාල වත්කම් හි නැවත අය කරගත හැකි අගයන් හි ඇස්තමේන්තුවක් සිදුකර අපහායන අලාභයන් පවතීද යන්න විමසා බැලිය යුතුය. තනි තනි වත්කම් හි නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කල නොහැකි අවස්ථාවන් හිදී මූල්‍ය උත්පාදන ඒකකයන් ලෙස ගෙන එහි නැවත අයකරගත හැකි අගයන් ඇස්තමේන්තු කිරීම වඩාත් යෝග්‍ය වේ.

නැවත අයකරගත හැකි අගය වන්නේ, ධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩුකල පසු ලැබෙන අගය සහ භාවිතයෙන් ලැබෙන වටිනාකමෙහි වඩා වැඩි අගයයි. භාවිතයෙන් ලැබෙන වටිනාකම අගය කිරීමේ දී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් එහි වර්තමාන අගයන් ලබාගැනීමට වට්ටම් කළයුතු අතර, එහිදී බදු පෙර වට්ටම් අනුපාතිකය භාවිතා කළයුතුය. එම වට්ටම් අනුපාතිකය වර්තමාන වෙළඳපලෙහි මුදල් සඳහා ඇති කාල අගයත් අදාල වත්කම් සඳහා වන නිශ්චිත අවදානමත් සැලකීමකින් හෝ ගැලපීමකින් තොරව ඇස්තමේන්තු කළ යුතුය.

වත්කමක (හෝ මුදල් උපදන ඒකකයක) නැවත අයකරගත හැකි අගය එහි වර්තමාන අගයට වඩා අඩුවන අවස්ථාවකදී එහි වර්තමාන අගය එහි නැවත අයකරගත හැකි අගය දක්වා අඩුකල යුතුය. අපහායන අලාභයන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ගැලපීම් කල යුතුය.

2.7 මූල්‍ය වත්කම්

2.7.1 වර්ගීකරණය

සමාගම තම මූල්‍ය වත්කම් ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කිරීම පහත පරිදි තීරණය කර ඇත.

ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු ව්‍යුත්පන්න කල නොහැකි, ස්ථිර හෝ නිශ්චිත වූ ගෙවීම් වලින් යුක්ත වන සක්‍රිය වෙළෙඳ පොළ තුල ලැයිස්තුගත නොවූ මූල්‍ය වත්කම් වේ. මේ තුල අන්තර්ගත වනුයේ ජංගම වත්කම් වන අතර ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන, කල් පිරීමේ කාලය මාස 12 ඉක්මවන මූල්‍ය වත්කම් අදාල වනුයේ නැත. සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ ලෙස වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ නැවත මිලදී ගත හැකි රාජ්‍ය බැඳුම්කර, රජයේ තාවකාලික අතිරික්ත අරමුදල් වල කර ඇති ආයෝජන, කලින් ගෙවීම්, තැන්පතු, සේවකයන්ට දුන් ණය, මුදල් හා මුදල් සමාන දෑ අඩංගු වේ.

2.7.2 හඳුනාගැනීම හා මුල්වරට අගය කිරීම

ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් මුල් වරට හඳුනා ගත යුත්තේ ආයතනය විසින් ගණුදෙනුව මුල් වරට උත්පාදනය කල දිනයේය. වත්කමක් මුල් වරට අගය කල යුත්තේ සාධාරණ අගයත්, සෘජුවම අදාල කළහැකි පිරිවැයත් යන අගයන්ගේ එකතුවක් ලෙසය.

මූල්‍ය වත්කම් හඳුනාගැනීම නවතා දැමිය යුත්තේ මූල්‍ය වත්කමකින් අරමුදල් ගලා ඒමේ අයිතිය කල් පිරුණු විටකදී හෝ එය වෙනත් පාර්ශවයකට මාරු කල විටකදී හා සමාගම සියලු අවදානම් හා ප්‍රතිලාභ සඳහා ඇති අයිතිය පැවරූ විටකදීය.

2.7.3 පසුකාලීනව සිදුකරනු ලබන අගය කිරීම

ණය සහ ලැබිය යුතු දෑ පසුකාලීනව අගය කල යුත්තේ සඵලදායී පොළී අනුපාතයට ගණනය කල ක්‍රමක්ෂය වූ පිරිවැයෙන් අපහායනය සඳහා වූ වෙන්කිරීම් අඩුකල පසු අගයටයි.

2.7.4 මූල්‍ය වත්කම් අපහායනය කිරීම

ක්‍රමක්ෂය වූ පිරිවැය මත පවත්වාගෙන යනු ලබන වත්කම්

සමාගම සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදීම තම මූල්‍ය වත්කම් හානිකරණයට ලක් වී ඇති බවට සාක්ෂි තිබේ ද නැද්ද යන්න විමසා බැලිය යුතුය. මූල්‍ය වත්කමක් අපහායනය කිරීම සහ එම අපහායන අලාභය දැරිය යුත්තේ, මුල්වරට හඳුනාගැනීමෙන් පසු ඇති වූ එක් හේතුවක් (සිදුවීමක්) හෝ හේතු කිහිපයක් නිසා අපහායනය වූ බවට සාක්ෂි ඇත්නම් පමණක් හා එම අලාභ සිදුවීමෙන් අනාගත මූල්‍ය ප්‍රවාහයන් මත ඇති වන්නා වූ බලපෑම විශ්වාසනීය ලෙස ආගණනය කලහැකි නම් පමණි.

ක්‍රමක්ෂය වූ පිරිවැය මත පවත්වාගෙන යනු ලබන ණය සහ ලැබිය යුතු දෑ වල අපහායන අලාභය හඳුනාගත යුත්තේ වත්කම පවත්වාගෙන යන අගය හා එම වත්කමේ අනාගත මුදල් ප්‍රවාහයන් සඵලදායි පොළී අනුපාතය මත වට්ටම් කල පසු අගය අතර ඇති වෙනසයි. (අනාගත මුදල් ප්‍රවාහයන් සැලකීමේ දී දරනු නොලබන අනාගත අපේක්ෂිත අලාභ අයත් නොවේ.) වත්කමේ පවත්වාගෙන යනු ලබන අගය කපාහල යුතු අතර අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සඳහා හඳුනා ගත යුතුය.

යම් හෙයකින්, පසු කාලපරිච්ඡේදයකදී, හඳුනාගත් අපහායන අලාභය අඩු වුවහොත් සහ එම අඩුවීම අපහායනය හඳුනාගත් පසු ඇතිවූ කිසියම් සිදුවීමකට අදාල කල හැකිනම් පමණක් කලින් හඳුනාගත් අපහායන අලාභය යලි ප්‍රත්‍යාවර්තනය කල හැකිය.

2.8 තොග

තොග අගය ප්‍රකාශයට පත්කල යුත්තේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් වලින් අඩු අගයටයි. පිරිවැය හඳුනාගත යුත්තේ බර තැබූ සාමාන්‍ය පිරිවැය අගය මත පදනම්වය.

2.9 වෙළෙඳ ලැබිය යුතු දෑ

වෙළෙඳ ලැබිය යුතු දෑ යනුවෙන් අදහස් කරනුයේ ආයතනයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලින් ඇති වූ විකුණුම් සඳහා පාරිභෝගිකයින් / ගැණුම්කරුවන්ගෙන් ලැබිය යුතු මුදල් වේ. ව්‍යාපාරයේ සාමාන්‍ය ව්‍යාපාරික චක්‍රය තුලදී එකතු කර ගැනීමට බලාපොරොත්තු වූ දෑ වන අතර ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

වෙළෙඳ වත්කම් මුල්වරට හඳුනාගත යුත්තේ සාධාරණ අගය නැතහොත් ලදුපත් අගය මත වන අතර පසුකාලීනව අගය කල යුත්තේ මුදලේ කාල වටිනාකමේ වැදගත් බලපෑමක් ඇති නොවන්නා වූ, කෙටි කාලයකදී ලබා ගැනීමට බලාපොරොත්තු වන සත්‍ය ලදුපත් අගයෙන් අපහායනය සඳහා වන වෙන්කිරීම් අඩුකල පසු අගයටයි.

සමාගම සෑම ගිණුම් කාලපරිච්ඡේදයක් අවසානයේදීම තම වෙළෙඳ ලැබිය යුතු දෑ අපහානය වී ඇති බවට සාක්ෂි පවතීද නැද්ද යන්න විමසා බැලිය යුතුය. වෙළෙඳ ලැබිය යුතු දෑ සඳහා වූ අපහායන සාක්ෂි තුල මුදල් එකතු කර ගැනීම සම්බන්ධව ආයතනයේ අතීත අත්දැකීම්, නැතහොත් විලම්භිත ගෙවීම් වල වැඩිවීමක් ඇතුලත් විය හැක. වෙළෙඳ ලැබිය යුතු දෑ අපහායනය වීම හා එම අපහායනය දැරිය යුත්තේ අපහායනය වූ බවට පැහැදිලි සාක්ෂි ඇත්නම් පමණි.

2.10 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල මුදල් හා මුදල් සමාන දෑ යන්න තුල අන්තර්ගත වනුයේ අතැති මුදල්, බැංකුවේ ඇති ඉල්ලුම් තැන්පතු, සත්‍ය කල්පිරීමේ කාලය මාස තුනක් හෝ ඊට අඩු ඉහල ද්‍රවශීලතාවයකින් යුතු වෙනත් කෙටිකාලීන ආයෝජනයන්ය.

2.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ප්‍රකාශිත ප්‍රාග්ධනය තුල අන්තර්ගත වනුයේ නිකුත් කල කොටස් හි අගය වේ. " සාමාන්‍ය කොටස් " හිමිකම් ලෙස වර්ගීකරණය කර ඇත.

2.12 මූල්‍ය වගකීම්

සමාගමේ වෙනත් මූල්‍ය වගකීම් තුල අන්තර්ගත වනුයේ වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ය. වෙනත් මූල්‍ය වගකීම් මුල්වරට හඳුනාගත යුත්තේ සාධාරණ අගය හා සෘජුවම අය කල හැකි පිරිවැය යන අගයන්ගේ එකතුවටය. මුල්වරට හඳුනාගැනීමෙන් පසු, මෙම මූල්‍ය වගකීම් අගය කර ඇත්තේ කෙටි කාලයක් තුල පියවා දැමීමට බලාපොරොත්තු වන, මුදලේ කාල වටිනාකමේ වැදගත් බලපෑමක් නොවන්නා වූ, සත්‍ය ලදුපත් අගය මතය.

සමාගම මූල්‍ය වගකීම් හඳුනා ගැනීම නවතා දමනුයේ ගිවිසුම් ගත වගකීම් විසර්ජනය කිරීමකදී, අවලංගු කිරීමකදී හෝ කල් පිරීමකදීය.

2.13 වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යනු ආයතනයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී සැපයුම්කරුවන්ගෙන් අත්පත් කරගත් භාණ්ඩ හා සේවා සඳහා ගෙවීමට ඇති මුදල් වේ. වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කල යුත්තේ ඒවා ආයතනයේ සාමාන්‍ය ව්‍යාපාරික චක්‍රය තුල සිදුවන බැවිනි.

වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මුල්වරට හඳුනාගත යුත්තේ සාධාරණ අගය නැතහොත් ගණුදෙනු වන මිල මත වන අතර පසුකාලීනව අගය කල යුත්තේ මුදලේ කාල වටිනාකමේ වැදගත් බලපෑමක් නොවන්නාවූ, කෙටිකාලයක් තුල පියවා දැමීමට බලාපොරොත්තු වන සත්‍ය ලදුපත් අගය මතය.

2.14 ජංගම හා විලම්භිත බදු

කාලපරිච්ඡේදය සඳහා වූ බදු වියදම තුල අන්තර්ගත වනුයේ ජංගම හා විලම්භිත බදු වේ. වෙනත් විස්තීර්ණ ආදායම් සඳහා අදාල වන්නා වූ අයිතමයන් හැරුන කොට, බදු වියදම සමාගමේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගෙන ඇත. මෙහිදී වෙනත් විස්තීර්ණ ආදායම් තුල බෙදා හඳුනාගෙන ඇත.

කාලපරිච්ඡේදය සඳහා අදාල වන්නා වූ ජංගම ආදායම් බද්ද ගණනය කොට ඇත්තේ කාලපරිච්ඡේදය අවසානයේ බල පවත්නා, සමාගමට අදාළ වන්නාවූ බදු නීතිය මත පදනම්වය. කළමනාකරණය විසින් බදු පාලනාධිකාරිය වෙත ගෙවීමට බලාපොරොත්තු වන අගය මත පදනම්ව, සුදුසු තැන්හිදී වෙන්කිරීම් සිදුකර ඇත.

විලම්භිත බදු හඳුනාගෙන ඇත්තේ වත්කම් හා වගකීම් සඳහා වන බදු පදනම සහ ඒවායේ පවත්වාගෙන යන අගය අතර ඇති වන්නාවූ තාවකාලික වෙනස්කම් මතය. ව්‍යාපාර ඒකාබද්ධ වීම්ද, එම ගණුදෙනුවෙන් ගිණුම්කරණ හෝ බදු අයවන ලාභය හෝ අලාභය මත වන බලපෑම හැරුණු කොට මුල්වරට හඳුනාගන්නා වත්කම් හා වගකීම් සඳහා විලම්භිත බදු ගණනය කර නැත. විලම්භිත බදු තීරණය කිරීම සඳහා කාලපරිච්ඡේදයේ අවසාන දිනට බලපවත්නා බදු අනුපාතයන් සැලකිල්ලට ගෙන ඇති අතර විලම්භිත බදු අදාල වන්නා වූ බදු වත්කම හඳුනාගැනීමේ දී හෝ බදු විලම්භිත ආදායම් බදු වගකීම පියවීමේ දී අදාල කරගැනීමට බලාපොරොත්තු වේ.

විලම්භිත බදු වත්කම් හඳුනාගනුයේ එම අනාගත බදු අයකල හැකි ලාභය තාවකාලික වෙනස් කමට එරෙහිව ලබාගත හැකි බව ප්‍රත්‍යක්ෂ නම් පමණි.

විලම්භිත බදු හිලව් කිරීමක් සිදුකල හැක්කේ ජංගම බදු වත්කම් වලට එරෙහිව ජංගම බදු වගකීම් හිලව් කිරීම සඳහා නෛතිමය වශයෙන් බල ගැන්වුනු හිමිකමක් ඇත්නම් පමණක් සහ ආදායම් බදු සඳහා අදාල වන්නා වූ විලම්භිත බදු හා විලම්භිත වගකීම් පැනවීම එකම බදු අධිකාරියක් විසින් සිදු කරන්නේ නම් පමණි.

2.15 සේවක ප්‍රතිලාභ

ආයතනය සතුව නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිශ්චිත දායකත්ව සැලසුම් යන සේවක ප්‍රතිලාභ සැලසුම් ඇත.

2.15.1 නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම් වූ කලී සමාගම විසින්, වෙනත් ආයතනයක් සඳහා නිශ්චිත දායක මුදලක් ගෙවනු ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ අරමුදලකි. මෙවන් ගෙවීමක් සඳහා ආයතනය සතුව තවදුරටත් පවත්නා වූ නෛතික හෝ ගිවිසුම් ගත බැඳීමක් නොමැත. දායකයන්, සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනාගනු ලබන්නේ ඒවා ගෙවිය යුතු නම් පමණි.

සමාගමක් විසින් සේවකයාගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% සේවක අර්ථසාධක අරමුදල වෙතටත් (EPF), 3% සේවා නියුත්තිකයන්ගේ භාර අරමුදල (ETF) වෙතටත් දායක වනු ලබයි.

2.15.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධව ආයතනයේ වගකීම වනුයේ කාලපරිච්ඡේදය අවසානයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හි වර්තමාන අගය වේ. වාර්ෂිකව මෙහි අගය කිරීම සිදු කරනු ලබන්නේ පුරෝකථනය කල ඒකක බැර ක්‍රමය භාවිතා කොට ගෙනය.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ පිරිවැය ආයුගණන වටිනාකම් තක්සේරුව මත තීරණය කරන ලදී. වට්ටම් අනුපාතය, වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය, අනාගත සේවක පඩි වැඩිවීම, මරණ අනුපාතය හා අනාගත විශ්‍රාම වැඩිවීම යන උපකල්පන මත ආයුගණනය ශේෂවල ගණනය කළ යුතුයි. තක්සේරුවේ සංකීර්ණත්වය මත සහ එහි දිගු කාලීන බව මත අදාල උපකල්පයන් සලකා බැලිය යුතු තරම් ස්ථාවර නොමැති අතර බැඳියාවද මෙම උපකල්පන හා ඇස්තමේන්තු මත වෙනස්වීමට අවස්ථාවක් පවතී. අදාල ඇස්තමේන්තුවලදී යොදාගත් ප්‍රධාන උපකල්පන මූල්‍ය වාර්තාවල සටහන් අංක 12 හි දැක්වේ.

2.15.3 කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

කෙටිකාලීන සේවක ප්‍රතිලාභ සඳහා වන වගකීම හඳුනාගනු ලබනුයේ සේවකයන් විසින් සපයන ලද සේවාවට අදාළව ගෙවීමට බලාපොරොත්තු වන, වට්ටම් නොකල අගය මතයි.

2.16 වෙන්කිරීම් හා අසම්භාව්‍ය වගකීම්

ක්‍රියාකාරී වියදම් සඳහා වෙන්කිරීමක් හඳුනා ගනු ලබන්නේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනය සතුව වර්තමාන නෛතික හා ගිවිසුම් ගත බැඳීමක් ඇති විටකදීත්, එම වගකීම පියවා දැමීම සඳහා සමාගමේ ආර්ථික සම්පත් පිටතට ගලායාම නිශ්චිත විටකදී, සහ එම අගයන් විශ්වාසනීය ලෙස තක්සේරු කල හැකි විටකදීය.

වෙන්කිරීම් අගය කරනුයේ වර්තමාන වගකීම් හා බැඳුනු අවදානම් හා අවිනිශ්චිතතාවයන් ඇතුලත්ව, වඩා විශ්වාසදායක සාක්ෂි මත පදනම්ව තක්සේරු කරන ලද වගකීම් පියවා දැමීම සඳහා අවශ්‍ය වන්නා වූ වියදම් මත වේ.

සම්පත් පිටතට ගලායාමේ හැකියාව නිර්ණය කිරීමට අපහසු වගකීම් හැරුණු විට, අන් සියලු අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන සටහන් තුල ප්‍රකාශයට පත් කර ඇත.

2.17 ආදායම් හඳුනා ගැනීම

ආදායම් හඳුනාගෙන ඇත්තේ ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවෙහි සාධාරණ අගයට වන අතර භාණ්ඩ විකුණුම් සඳහා ලැබිය යුතු අගයන් ප්‍රකාශ කර ඇත්තේ වට්ටම් මත වූ බද්ද අඩුකර ශුද්ධ අගයටය. සමාගම ආදායම් හඳුනාගනු ලබන්නේ එම ආදායමේ වටිනාකම පැහැදිලිව හඳුනාගත හැකි විටදී සහ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලා ඒමේ හැකියාව ප්‍රත්‍යක්ෂ විටදී පමණි.

ආයතනය විසින් ව්‍යාපාරය තුල උත්පාදනය වන්නා වූ ප්‍රධාන ගණයේ ආදායම් හඳුනා ගැනීමට පහත දැක්වෙන ආදායම් හඳුනා ගැනීමේ නිර්ණායක භාවිතා කර ඇත.

2.17.1 භාණ්ඩ විකුණුම්

භාණ්ඩ විකුණුම් වලින් උත්පාදනය වන ආදායම හඳුනාගනුයේ එම භාණ්ඩ වලට අදාළ සියලුම අවදානම් හා ප්‍රතිලාභයන් පාරිභෝගිකයා වෙත භාරදෙනු ලබන අවස්ථාවේ දීය.

2.17.2 පොළී ආදායම්

පොළි ආදායම හඳුනා ගනු ලබන්නේ සඵලදායී පොළී ක්‍රමය භාවිතා කොට ගෙනය.

2.17.3 දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමෙන් ඇතිවන ලාභ හා අලාභ

වත්කමේ පවත්වාගෙන යන අගය හා විකුණුම් අගය සැසඳීමෙන් දේපළ, පිරියත හා උපකරණයන්හි ඉවත් කිරීමේ ලාභ හා අලාභ හඳුනා ගනු ලබන අතර එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනු ලබයි.

2.18 වියදම්

ව්‍යාපාරයේ මෙහෙයුම් සිදුකරගෙන යාමේදී දරන ලද සියලුම වියදම්, ලාභය හඳුනා ගැනීමේ දී ආදායමට එරෙහිව කපාහල යුතුය.

2.19 ගිණුම් කාලපරිච්ඡේදය අවසානයට පසු හටගන්නා සිදුවීම්

ගිණුම් කාලපරිච්ඡේදයෙන් පසු ඇතිවන සියලු වැදගත් සිදුවීම් සැලකිල්ලට ගතයුතු අතර සුදුසු ගැලපීම් හා හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනය තුල අදාල සටහන් වල හෙළිදරව්කර ඇත.

2.20 වගකීම් (බැඳීයාව)

ගිණුම් කාලපරිච්ඡේදය අවසානයට ඇති සියළු වගකීම් (බැඳීම්) හඳුනාගෙන සටහන් තුලින් හෙළිදරව් කර ඇත.

2A වැදගත් ගිණුම්කරණ තක්සේරු කිරීම් හා මතයන්

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනා ගැනීම හා අගය කිරීම සිදුකල යුතු අතර, ඒ සඳහා කළමනාකරණය විසින් විවිධ වු මත, ඇස්තමේන්තු හා උපකල්පන සැලකිල්ලට ගත යුතුය.

2A.1 පහත දැක්වෙනුයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වැදගත් බලපෑමක් කල හැකි මූල්‍ය / ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ දී භාවිත කරන වැදගත් මතයන්ය.

2A1.1 විලම්භිත බදු වත්කම් හඳුනා ගැනීම

විලම්භිත බදු වත්කම් කෙතරම් දුරකට හඳුනා ගන්නවාද යන්න තීරණය වනුයේ අනාගත බදු ආදායමට එරෙහිව උපයෝගි කලහැකි විලම්භිත බදු වත්කමේ සම්භාවිතාව මතය.

2A.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීමේ දී හා අගය කිරීමේ දී බොහෝ දැනෙන බලපෑමක් කලහැකි උපකල්පන හා තක්සේරු කිරීම් පහත දැක්වේ

2A.2.1 ක්ෂය කල හැකි වත්කමක ඵලදායී ජීව කාලය

වත්කමක ආර්ථික උපයෝගීතාව මත පදනම්ව, කළමනාකරණය විසින් සෑම ගිණුම් කාලච්ඡේදයක් අවසානයේදීම ක්ෂය කල හැකි වත්කමක ඵලදායී ජීව කාලය තක්සේරු කල යුතුය. මෙම තක්සේරු වල අවිනිශ්චිතතාවයන් තාක්ෂණික යල් පැනීම් සමග සම්බන්ධ වන අතර, මෘදුකාංග හා තොරතුරු තාක්ෂණික උපාංගයන්ගේ උපයෝගීතාවය වෙනස් කිරීම කෙරෙහි බලපානු ඇත.

2A.2.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීමේ වර්තමාන අගය තීරණය කිරීමෙහි ලා උපකල්පන ගණනාවක් මත ගොඩනැගුණු පුරෝකථනය කල ඒකක බැර ක්‍රමය මතයි. මෙය සඳහා සාධක ගණනාවක් බලපානු ලැබේ. මෙම උපකල්පන, ශුද්ධ පිරිවැය තීරණය කිරීමට හා වට්ටම් අනුපාත ඇතුලත් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්, වගකීම තීරණය කිරීමේ දී බලපානු ලැබේ. මෙම උපකල්පනයන්ගේ සිදුවන කිසියම් වෙනස්වීමක්, නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ පවත්වාගෙන යන අගය කෙරෙහි බලපානු ලැබේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2015 රු.	2014 රු.

සටහන 03 පිරිවැටුම

රූටයිල්	91,792,400	296,626,053
ඉල්මනයිට්	283,964,199	279,308,542
සර්කෝන්	78,393,152	157,739,627
හයි.ටයි.ඉල්මනයිට්	53,901,154	74,802,628
නන් මැග්නටික් ටේලින්ස්	1,157,136,561	---------
මැග්නටයිට්	----------	40,788
සර්කෝන් කෑඩි	----------	411,287,100
ස්පයිරල් ෆයින් කොන්සන්ට්‍රේට්	22,891,647	----------
	1,688,079,113	1,219,804,738

සටහන 03A – පිරිවැටුම

අපනයන (විකුණුම්)	1,444,897,849	1,219,582,032
දේශීය (විකුණුම්)	243,181,264	222,706
	1,688,079,113	1,219,804,738

සටහන 04 විකුණුම් පිරිවැය

රූටයිල්	31,842,973	80,719,006
ඉල්මනයිට්	254,435,525	117,398,360
සර්කෝන්	18,880,618	43,241,890
හයි.ටයි.ඉල්මනයිට්	144,202,750	118,027,118
නන් මැග්නටික් ටේලින්ස්	285,263,255	----------
මැග්නටයිට්	----------	52,963
සර්කෝන් කෑඩි	----------	166,162,905
ස්පයිරල් ෆයින් කොන්සන්ට්‍රේට්	131,790,627	----------
	866,415,748	525,602,242

සටහන 05 වෙනත් මෙහෙයුම් ආදායම්

විනිමය ලාභ	----------	10,809,563
ප්‍රමාද ගාස්තුවලින් ලද ආදායම	63,950,108	9,766,548
වත්කම් විකිණීමෙන් ලද ලාභය	1,977,103	----------
	65,927,211	20,576,111

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2015 රු.	2014 රු.

සටහන 06 මූල්‍ය ආදායම්

පාරිතෝෂික අරමුදලේ ආයෝජන තුලින් ලද පොළිය		260,397	256,827
සාමාන්‍ය ආයෝජනයෙන් ලද පොළිය		27,223,468	6,011,587
කාර්ය මණ්ඩලය ලබා ගත් ණය මත පොළිය හා අනෙකුත් ආදායම්		6,942,974	15,245,445
නිවාස ණය තුලින් ලද පොළිය - ශ්‍රී.ලං.නි.ස.මු.සං.බැංකුව		2,371,178	1,750,594
විදේශීය මුදල් ගිණුම තුලින් ලද පොළිය		249,977	78,826
S.R.M.C.L. ණය මත පොළිය		2,500,000	2,500,000
අලාභ ටෙන්ඩර් තැන්පතු		30,088,890	9,703,890
		69,636,884	35,547,169

සටහන 07 ප්‍රවර්ථන ආදායම් බදු වියදම

වර්ෂය සඳහා වෙන් කිරීම	7.1	28,500,000	--------
පෙර වර්ෂය සඳහා ගැලපීම්		---------	--------
විලම්භිත බදු	7.2	17,484,819	(1,882,404)
		45,984,819	(1,882,404)

සටහන 7.1 – ආදායම් බදු වියදම් සැසඳුම

බදු පෙර ලාභය		502,754,508	327,609,173
ඉඩ නොදෙන වියදම් වල එකතුව		227,300,745	120,490,554
ඉඩ දිය හැකි වියදම් වල එකතුව		(203,283,830)	(254,462,044)
අනෙකුත් අදායම් මාර්ග වල ආදායම්හි එකතුව		(39,547,993)	(25,843,279)
වර්ෂය සඳහා බදු අයවන ව්‍යාපාරික ලාභය/ (අලාභය)		**487,223,430**	**167,794,404**
බද්දට යටත් වන අනෙකුත් ආදායම්		39,298,017	25,764,453
එකතු ව්‍යවස්ථාපිත ආදායම්		**526,521,447**	**193,558,857**
වගන්ති 32 ට අනුව අඩු කිරීම්		(118,083,423)	(59,341,234)
තක්සේරු ගත ආදායම		**408,438,024**	**134,217,623**
සුදුසුකම් ලබන ගෙවීම්		(171,381,869)	(134,219,688)
බද්දට යටත් ආදායම		**237,056,155**	**(2,065)**
වර්තමාන ආදායම් බදු වියදම 12% මත		28,446,738	(248)
ආසන්න අගයට කළ ගැලපීම		28,500,000	-----
		---------	-----

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2015 රු.	2014 රු.

සටහන 7.2 – විලම්බිත බදු වියදම

තාවකාලික වෙනස සටහන් කිරීම	17,484,819	(1,882,404)

සටහන 8 මූලික කොටසක ඉපයීම

මූලික කොටසක ඉපයීම ගණනය කිරීම පදනම් වී ඇත්තේ සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් ශුද්ධ ලාභය, වර්ෂය තුල බර තැබූ සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් බෙදීමෙනි.

සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් ශුද්ධ ලාභය	456,769,689	329,491,578
වර්ෂය තුළ බර තැබූ සාමාන්‍ය කොටස් ප්‍රමාණය	80,000,000	80,000,000
කොටසක ඉපයීම (රු.)	5.71	4.12

සටහන 09 දේපළ, පිරියත හා උපකරණ

රු.

විස්තරය	01.01.2015 දිනට ශේෂය	එකතු කිරීම්	(ඉවත් කිරීම්) / ගැලපීම්	31.12.2015 දිනට ශේෂය
පිරිවැය				
සින්නක්කර ඉඩම්	3,029,245	--------	------	3,029,245
වැඩබිම් සංවර්ධනය	41,534,837	--------	------	41,534,837
ගොඩනැගිලි	105,906,308	397,300	------	106,303,608
යන්ත්‍ර හා පිරියත	522,820,568	106,793,846	------	629,614,415
මෙවලම් හා උපකරණ	43,748,019	1,961,885	728,276	44,981,627
ලී බඩු, සවිකිරීම් හා උපකරණ	25,376,326	1,986,651	149,092	27,213,885
මෝටර් රථ	141,610,782	36,770,889	------	178,381,671
ජල සැපයුම් යෝජනා ක්‍රමය	14,694,456	--------	------	14,694,456
මුහුදු යාත්‍රා	10,931,234	--------	------	10,931,234
පරිගණක දෘඩාංග	17,468,255	567,122	1,230,728	16,804,649
	927,120,030	148,477,693	2,108,096	1,073,489,627
ක්ෂය කිරීම්				
වැඩබිම් සංවර්ධනය	6,547,874	2,058,926	------	8,606,800
ගොඩනැගිලි	53,323,970	3,044,505	------	56,368,475
යන්ත්‍ර හා පිරියත	267,184,943	42,949,359	------	310,134,302
මෙවලම් හා උපකරණ	25,424,067	3,176,416	669,580	27,930,903
ලී බඩු, සවිකිරීම් හා උපකරණ	11,226,769	2,137,884	143,473	13,221,180
මෝටර් රථ	122,165,395	19,650,540	------	141,815,935
ජල සැපයුම් යෝජනා ක්‍රමය	14,538,854	49,603	------	14,588,457
මුහුදු යාත්‍රා	10,005,586	115,105	------	10,120,691
පරිගණක දෘඩාංග	13,609,922	2,044,311	1,230,713	14,423,520
	524,027,380	75,226,649	2,043,766	597,210,263
ශුද්ධ ධාරණ අගය	403,092,650	--------	----------	476,279,363
ප්‍රාග්ධන නොනිමි වැඩ	111,056,344	192,226,654	----------	303,282,999
	514,148,994	192,226,654	----------	779,562,362

09.1 සමාගම රු.16,256,251/_ වටිනාකමකින් යුතු දේපල පිරිහා උපකරණ මෙම වර්ෂය තුළ එකතු කිරීම් කර තිබේ. (9,215,055/_ - 2014)

09.2 සමාගමේ ඉඩම් හා ගොඩනැගිලි වල විස්තර පහත පරිදිවේ.

දේපල	**ඉඩමේ ප්‍රමාණය**	**ගොඩනැගිලි ප්‍රමාණය**	**පිරිවැය**
කෝකිලායි ඉඩම			2,482,646
පුල්මුඩේ කර්මාන්ත ශාලාව			540,448
			3,023,094

සටහන 10 කල්බදු වත්කම්

රු.

විස්තරය	01.01.2015 දිනට ශේෂය	එකතු කිරීම්	(ඉවත් කිරීම්) ගැලපීම්	31.12.2015 දිනට ශේෂය
පිරිවැය				
කල්බදු ඉඩම්	24,068,800	153,534	---	24,222,334
ක්‍රමක්ෂය				
කල්බදු ඉඩම්	1,288,938	456,943	---	1,745,882
ශුද්ධ ධාරණ අගය	22,779,862	-------	---	22,476,452

10.1 2015 මැයි මස 5 වන දින සමාගම නාගරික සංවර්ධන අධිකාරියෙන් අවු. 30 බදු පදනම මත ඉඩමක් අත්පත් කර ගන්නා ලදී. එය අදාල බදු කාල සීමාව තුළ ක්‍රමක්ෂය කරනු ලබයි.

11 අස්පෘශ්‍ය වත්කම්

රු.

විස්තරය	01.01.2015 දිනට ශේෂය	එකතු කිරීම්	(ඉවත් කිරීම්) ගැලපීම්	31.12.2015 දිනට ශේෂය
පිරිවැය				
පරිගණක මෘදුකාංග	3,474,719	17,500	---	3,492,219
ක්‍රමක්ෂය				
පරිගණක මෘදුකාංග	2,896,106	337,863	---	3,233,969
ශුද්ධ ධාරණ අගය	578,613	-----	---	258,250

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2015 රු.	2014 රු.

සටහන 12 විලම්භිත බදු

	2015 රු.	2014 රු.
ජනවාරි 01 දිනට ශේෂය	14,616,137	16,498,541
ආදායම් ප්‍රකාශනයට අය කිරීම	17,484,819	(1,882,404)
වර්ෂය තුළ සලකා බැලූ වත්කම්	---------	---------
දෙසැම්බර් 31 දිනට ශේෂය	32,100,956	14,616,137

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සටහන 12A විලම්භිත බදු වගකීම

	ධාරණ අගය	බදු පදනම	තාවකාලික වෙනස 2015	තාවකාලික වෙනස 2014
දේපල පිරියත හා උපකරණ ප්‍රාග්ධන දීමනා මත විලම්භිත බදු වගකීම	499,014,066	164,275,557	334,738,508	188,223,230
විශ්‍රාම පාරිතෝෂිත බැඳියාව මත විලම්භිත බදු වත්කම	(67,657,864)	----------	(67,657,864)	(66,454,553)
			267,080,644	121,768,677

සටහන 12A විලම්භිත බදු වගකීම

	ධාරණ අගය	බදු පදනම	තාවකාලික වෙනස 2015	තාවකාලික වෙනස 2014
දේපල පිරියත හා උපකරණ ප්‍රාග්ධන දීමනා මත විලම්භිත බදු වගකීම	334,738,508	99.88* 12%	40,120,418	22,582,270
	334,738,508	0.12* 28%	112,472	10,541
			40,232,890	22,592,811
විශ්‍රාම පාරිතෝෂිත බැඳියාව මත විලම්භිත බදු වත්කම	67,657,864	99.88* 12%	8,109,201	7,972,951
	67,757,864	0.12* 28%	22,733	3,721
			8,131,934	7,976,673
ශුද්ධ විලම්භිත බදු වගකීම			32,100,956	14,616,137

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සටහන 13 අත්තිකාරම්

	2015 රු.	2014 රු.
සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	500,000,000	500,000,000
රාජ්‍ය වැවිලි සංස්ථාවට ණය දීම	25,000,000	25,000,000
ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ණය දීම	15,000,000	15,000,000
ජනතා කඩදාසි සමාගමට ණය දීම	5,000,000	5,000,000
ලැබිය යුතු පොළිය	9,921,448	7,421,448
	554,921,448	552,421,448

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2015 රු.	2014 රු.

සටහන 14 විශ්‍රාමික පාරිතෝෂිත බැඳියාවට වූ ආයෝජන

ජනවාරි 01 දිනට ශේෂය		66,454,553	45,598,665
ප්‍රවර්ථන සේවය පිරිවැය		3,366,720	3,719,301
පොළී පිරිවැය		7,150,510	5,266,646
		76,971,783	54,584,612
වර්ෂය තුළ පාරිතෝෂිත ගෙවීම්		(13,187,595)	(6,798,875)
ආයුගණන (ලාභ)/අලාභ		3,873,676	18,668,816
		67,657,864	66,454,553
සැලසුම් වත්කම්වල සාධාරණ අගය	14 A	(4,106,537)	(3,872,179)
දෙසැම්බර් 31 දිනට ශේෂය		63,551,327	62,582,374

සටහන 14 A සැලසුම් වත්කම්වල සාධාරණ අගය

රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල	4,106,537	3,872,179

සටහන 14 B සැලසුම් වත්කම්වල සාධාරණ අගය

වර්තමාන වටිනාකම ඇතුළත් විශ්‍රාම පාරිතෝෂිත බැඳියාව ගණනය කිරීම සඳහා මූලධර්ම ආයුගණක උපකල්පනය භාවිත කරන ලබයි.

	2015	2014
වට්ටම් අනුපාතය	10.76 %	10.00 %
වැටුප් වැඩිවීම් අනුපාතය	------	1.87 %
විශ්‍රාම වයස	60 Years	60 Years
සේවය හැර යාමේ අනුපාතය		
අවු 55 දක්වා	1.00 %	2.00 %
ඉන්පසු	0.00 %	0.00 %

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද,කළමනාකරණ චක්‍ර ලේඛ අංක 30 අනුව, වැටුප් වැඩිවීමේ අනුපාතය සකසා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2015 රු.	2014 රු.
සටහන 15 තොග			
පාරිභෝගික හා අමතර කොටස්		205,816,125	203,198,296
අමුද්‍රව්‍ය හා අතරමැදි නිෂ්පාදන		5,245,953	7,519,207
නිමි තොග			
- ඉල්මනයිට්		136,803,434	162,853,095
- රූටයිල්		23,794,882	12,761,387
- සර්කොන්		5,203,489	6,555,211
- කෘඩ් සර්කොන්		---------	11,239,707
- හයි ටයිටේනියම් ඉල්මනයිට්		13,027,816	118,948,803
- කෘඩ් මොනසයිට්		7,722,677	7,104,104
- තෙත මේස මිඩ්ලින්ස්		228,160,304	80,545,763
- ස්පයිරල් ෆයින් කොන්සන්ට්‍රේට්		55,999,529	149,461,452
- මැග්නටයිට්		3,786,564	971,619
- නොන් මැග්නටික් ටේලින්ස්		113,570,689	198,180,125
විවිධ අයිතම		1,026,665	1,419,619
		800,158,127	960,758,388
සටහන 16 කෙටිකාලීන මූල්‍ය වත්කම්			
භාණ්ඩාගාර බිල්පත්		205,000,000	359,564,354
ණයගැති පොළී		3,640,110	1,004,779
		208,640.110	360,569,133
සටහන 17 අත්තිකාරම් සහ තැන්පතු			
අත්තිකාරම් හා තැන්පතු		14,414,611	95,354,664
		14,414,611	95,354,664
සටහන 18 ඉදිරියට කල ගෙවීම්			
ඉදිරියට කරන ලද වියදම්		35,444,787	33,621,383
		35,444,787	33,621,383
සටහන 19 අනෙකුත් ජංගම වත්කම්			
ලැබිය යුතු එකතු කළ අගය මත බදු		109,489,716	89,461,390
විවිධ ණය ගැතියෝ		1,000	1,000
නිවාස ණය - නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව		81,222,979	72,818,877
වෙනත් ණය ගැතියෝ		27,025,170	13,795,346
සේවක ණය හා අත්තිකාරම්		112,570,332	64,082,136
		330,309,197	240,158,749
අඩුකලා - අපහායනය	19.1	(224,982)	(224,982)
		330,084,215	239,933,767

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		2015 රු.	2014 රු.

සටහන 19.1 හානිකරනය/අපහායනය

වෙළඳ ලැබීම් වලට අදාලව අපහායනය සඳහාවූ වෙන් කිරීම් වල වෙනස්වීම පහත පරිදි වේ.

	2015	2014
ජනවාරි 01 දිනට ශේෂය	224,982	437,482
වර්ෂය තුළ නැවත අයකර ගැනීම	-------	(212,500)
වර්ෂය අවසානයට ශේෂය	224,982	224,982

සටහන 20 මුදල් හා මුදල් වලට සමාන දෑ

		2015	2014
ලංකා බැංකුව, විදේශ මුදල් ගිණුම	0073449850	17,221,963	30,318,372
ලංකා බැංකුව, ආයතන ශාඛාව	0000000931	572,561	437,841
ලංකා බැංකුව, කඩ වීදි ශාඛාව, ත්‍රිකුණාමලය	00002367534	170,789	311,022
හැටන් නැෂනල් බැංකුව,කුරුඳුවත්ත ශාඛාව	076010004078	257,329	281,043
මහජන බැංකුව, පුල්මුඩේ	352-1001-5-0000244	53,261	233,030
අතැති මුදල් - පුල්මුඩේ		161,151	167,881
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය		20,000	20,000
		18,457,054	31,769,189

සටහන 21 ප්‍රකාශිත ප්‍රාග්ධනය

	2015	2014
නිකුත් කල හා ගෙවා නිමකල 80,000,000 (සාමාන්‍ය කොටස්	800,000,000	800,000,000

සටහන 22 වෙනත් සංචිත

	2015	2014
මුහුදු යාත්‍රා රක්ෂණ නිදන් අරමුදල් සංචිතය	111,000,000	111,000,000
යන්ත්‍ර හා පිරියත ප්‍රතිස්ථාපන හා වැඩි දියුණු කිරීමේ නිදන් අරමුදල් සංචිතය	706,346,958	706,346,958
ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිලි නිදන් අරමුදල් සංචිතය	171,149,673	171,149,673
සේවක වන්දි නිදන් අරමුදල් සංචිතය	10,246,238	10,246,238
සුනාමි අළුත්වැඩියා නිදන් අරමුදල් සංචිතය	18,801,474	18,801,474
	1,017,544,343	1,017,544,343

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2015 රු.	2014 රු.

සටහන 23 රඳවා ගත් ඉපයීම්/(අලාභ)

	2015	2014
ආරම්භක ශේෂය	163,628,725	(133,194,037)
භාණ්ඩාගාරයට ලාභාංශ	(158,500,000)	(14,000,000)
වර්ෂය සඳහා ලාභය/(අලාභය)	452,896,012	310,822,761
	458,024,737	163,628,724

සටහන 24 ආදායම් බදු වගකීම්

	2015	2014
ජනවාරි 01 දිනට ශේෂය	(16,655,430)	13,028,588
වර්ෂය සඳහා වෙන් කිරීම්	28,500,000	---------
වර්ෂය තුළ ගෙවීම්	(3,000,000)	3,626,842
ඌණ/අධි වෙන් කිරීම් ගැලපීම්	(2,748,386)	---------
දෙසැම්බර් 31 දිනට ශේෂය	6,096,184	16,655,430

සටහන 25 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

	2015	2014
ගැණුම්කරුවන්ගෙන් ලද අත්තිකාරම්	107,569,661	524,673,039
සුළු ණයහිමියෝ	10,054,748	17,159,513
ටෙන්ඩර් තැන්පතු	2,929,526	85,738,402
රඳවාගත් මුදල්	17,895,201	13,693,040
සේවක වැටුප් හා ගෙවීම්	8,777,474	5,839,884
ගෙවියුතු රඳවාගත් බදු	163,066	163,066
උපචිත විශ්‍රාම පාරිතෝෂික	108,728	108,728
ගෙවිය යුතු ලාභාංශ	158,500,000	14,000,000
වෙළඳ ණයහිමියෝ	931,700	931,700
	306,930,104	662,307,372

සටහන 26 වෙන්කිරීම් හා උපචිත වියදම්

	2015	2014
ප්‍රධාන කාර්යාලය	27,274,867	7,074,464
පුල්මුඩේ	52,894,897	28,039,645
	80,169,764	35,114,109

සටහන 27 කෙටිකාලීන ණය

	2015	2014
කෙටිකාලීන ණය	-------	72,644,277
ගෙවිය යුතු පොළිය	-------	153,534
	-------	72,797,811

සටහන 28 සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම

28.1 ප්‍රධාන කළමනාකාරණ පාර්ශවයන් සමග ඇතිවන්නාවූ ගණුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 සම්බන්ධිත පාර්ශව හෙළිදරව් අනුව ප්‍රධාන කළමනාකාරිත්ව පාර්ශවයන් සමාගමේ, ක්‍රියාකාරකම් හා සැලසුම්කරණය කිරීම්, මග පෙන්වීම සඳහා සහ පාලනය කිරීම් සඳහා වගකීමක් පවතිනු ඇත. එම නිසා, අධ්‍යක්ෂක කළමනාකාරිත්ව මණ්ඩලය (විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්) ඇතුලත්ව ප්‍රධාන කළමනාකාරිත්ව මණ්ඩලය වර්ගීකරණය කළ හැකිය.

ප්‍රධාන කළමණාකරන පාර්ශවයන් සමග වූ ගනුදෙනු පහත පරිදි වේ;

	2015 දෙසැම්බර් 31	2014 දෙසැම්බර් 31
ප්‍රධාන කළමනාකරණ පාර්ශවයන් සඳහා දරණ ලද වියදම්	1,792,384	2,141,250
ප්‍රධාන කළමනාකරණ පාර්ශවයන් සඳහා ලද ණය සහ අත්තිකාරම්	Nil.	Nil.

28.2 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

සැලකිය යුතු සම්බන්ධිත පාර්ශව ගනුදෙනු වල තොරතුරු පහත පරිදි වේ;

ආයතනයේ නම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	වටිනාකම	2014
භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් සමාලෝචනය	සම්බන්ධිත ව්‍යාපාර	ගෙවන ලද පුරස්කාර	118,083,423	59,341,234
ජනතා වතු සංවර්ධන අධිකාරිය	සම්බන්ධිත ව්‍යාපාර	ණය ලැබීම්	15,000,000	15,000,000
ජාතික කඩදාසි සමාගම	සම්බන්ධිත ව්‍යාපාර	ණය ලැබීම්	5,000,000	5,000,000
මහ බැංකුව	සම්බන්ධිත ව්‍යාපාර	තැන්පතු වලින් උපයන ලද පොළී	--------	5,851,058
		තැන්පතු වලින් ආපසු ගැනීම්	1,303,300,000	973,305,685

සටහන29 වාර්තා කරන කාලච්ඡේදය අවසානයට පසුව පැන නැගෙන සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍යවන සිදුවීමක් වාර්තාකරන කාලච්ඡේදය අවසානයට පසුව පැන නැගී නොමැත.

සටහන 30 බැඳීම්

බණිජ වැලි තොග ඇපයට තබා රු.මිලියන 100 ක් වටිනා අයිරා පහසුකමක් ලංකා බැංකුවෙන් ලබාගෙන ඇත. නමුත් මෙම පහසුකම ශේෂපත්‍ර දිනට භාවිතාකර නොමැත.

යන්ත්‍ර හා උපකරණ ආනයනය සඳහා එම යන්ත්‍ර හා උපකරණම ඇපයට තබා රු.මිලියන 550-ක ඇමරිකන් ඩොලර් මිලියන 4.2 ක ණය පහසුකමක් ලංකා බැංකුවෙන් ලබාගෙන ඇත. 2015.12.31 දිනට එහි ශේෂය වූ ඇමරිකන් ඩොලර් 562,799/-ක මුදල 2015.01.07 දින පොළියත් සමග ගෙවා ඇත.

සටහන 31 අසම්භාවයන්

මූල්‍ය වාර්තාවල ගැලපීමකට හෝ හෙළිදරව් කිරීමකට අවශ්‍යවන අසම්භාව්‍ය වගකීමක් වාර්තාකරන කාලච්ඡේදය අවසානයට පසුව පැන නැගී නොමැත.